# ප්‍රශ්නය හා විසඳුම

පඬියෝ නැවතත් පඬිවදන් දෙසති. ආණ්ඩුව හමුදා මෙහෙයුම්වලින් කොටි ත්‍රස්තවාදීන් පරදවා ඇති නමුත් ප්‍රශ්නයට දේශපාලන විසඳුමක් දිය යුතු යැයි ඔවුහු තම පඬි මුව සකස්කරමින් පඬිබව ආරෝපණය කරගනිමින් පවසති. ඔවුන් එසේ පවසන විට මෙතරම් පඬියන් තවත් ලෝකයේ නැතැයි ඇතැමුනට සිතෙනු වැළැක්විය නො හැකි ය. මේ පඬියෝ විවිධ තැන් අරක්ගෙන සිටිති. ඔවුන්ගේ තරම දැනගත හැක්කේ අවුරුදු කිහිපයකට පෙර ඔවුන් ම හෝ වෙනත් අය හෝ කී කරුණු සලකා බැලීමෙනි. ප්‍රභාකරන් හා කොටි පැරදවිය නොහැකි යැයි ද ඔවුන් ලෝකයේ ඉහළම ගරිල්ලා සටන්කරුවන් යැයි ද පඬියෝ අපට පුන පුනා කීහ. කොටි ලෝකයේ ඉහළම හරිල්ලා භටයන් නම් ඔවුන් පැරදවූ අපේ ත්‍රිවිධ හමුදාවට හා පොලීසියට ලෝකයේ දෙන්නට තැනක් නැත. ඒ කුමක් වුවත් අපේ හමුදාව ලෝකයේ වෙනත් කිසිම හමුදාවකට වඩා අතිශයන් ම ශ්‍රේෂ්ඨ විනය ගරුක හමුදාවක් බව නොකියා ම බැරිය. අප අපේ හමුදාව ත්‍රස්තවාදයට විරුද්ධ සටන්වල දී ලෝකයේ හොඳම හමුදාව බව කීවේ කලකට පෙර ය. කොටි පැරදවීය හැකි බව හා පැරදවිය යුතු බව අප බොහෝ කලකට පෙර කී විට පඬියෝ අපට යුදවාදී ජාතිවාදී ආදී විශේෂණ පටබැන්දෝ ය.

කොටි පැරදවීමෙහි ලා කරුණු හතරක් බලපෑවේ ය. පළමුවෙන් ම වීරෝදාර රණවිරුවන්ගේ (පොලීසිය හා විශේෂ කාර්ය බලකාය ද ඇතුළු) කැපකිරීම, රණශූරත්වය, දේශ ප්‍රේමීත්වය ආදී මහඟු ගුණ ය. ජීවිත පරදුවට තබා රට වෙනුවෙන් සටන් වැදුණු ඔවුහු ජීවිත පූජා කළහ. තවත් විටෙක ආබාධිත වූහ. ජීවත්වන රණවිරුවන්ට හා මියගිය රණවිරුවන්ගේ උරුමක්කරුවන්ට අප සලකනවා මදි ය. ඔවුන්ට ඔවුන් සටන් වැදි උතුරු හා නැගෙනහිර පළාත්වල ඉඩම් ලබාදීමේ ක්‍රමයක් වහා ක්‍රියාත්මක කළ යුතු ය. ඒ පළාත් සශීක කිරීමේ කර්තව්‍යයට ද ඔවුන් මැදිහත් කරගත යුතුව ඇත. කොටි පැරදවීමෙහි ලා බල පෑ දෙවැනි සාධකය වූයේ ආරක්ෂක අමාත්‍යංශයේ ලේකම්තුමා, හමුදාපතිතුමා ඇතුළු ත්‍රිවිධ හමුදා නායකත්වය විසින් කරන ලද දක්ෂ මෙහෙයවීම් ය. හමුදා නායකත්වය නොවන්නට මේ ජයග්‍රහණ ලබාගත නොහැකි බව අමුතුවෙන් කිවයුතු නො වේ. මෙහි දී තවත් විශේෂ පුද්ගලයන් දෙදෙනකු අපේ සිහියට නැගෙයි. ඒ පනස්හයෙන් පසුව ආරක්ෂක අමාත්‍යංශයේ ලේකම් ධුරය දැරූ එන් .කියු දියෙස් මහතා හා ආනන්ද විද්‍යාලයේ කලක් විදුහල්පති වූ එල්. එච්. මෙත්තානන්ද මහතා ය. බ්‍රිතානි ගැති හමුදා නායකත්වයක් දේශප්‍රේමී හමුදා නායකත්වයක් බවට පත්කිරීම සඳහා ඔවුන් ගත් උත්සාහය නොවන්නට වත්මන් හමුදා නායකත්වය බිහි නොවන්නට තිබිණි. එසේ නොවන්නට 1962 දී මෙන් 2005න් පසුව ද හමුදා පල්ලි කුමන්ත්‍රණ සිදුවීමට තිබුණි. එමෙන් ම බටහිරයන් ඉදිරියේ කොන්ද නමන කොමිස් කාක්කන්ගෙන් හමුදා නායකත්වය සමන්විතවීමට තිබුණි. ත්‍රස්තවාදයට එරෙහිව සටන් මෙහෙයවූ ලෝකයේ දක්ෂතම හමුදාපතිවරයා සරත් ෆොන්සේකා මහතා විය යුතු ය.

තුන්වැනුව ඇත්තේ ජනාධිපතිතුමාගේ දේශපාලන නායකත්වය ය. මෙතෙක් කල් ජනාධිපතිවරුන් ජනාධිපතිනියන් හා රනිල් වික්‍රමසිංහ කෙළේ කොටි පැරදවීමට නොහැකිය යන බයිලාව කීම පමණකි. කොටි අනභිබවනීය වේ යන්න ඔවුන්හේ කණට මී පැණි මෙන් විය. නිවටයකු මෙන් සටන්විරාම ගිවිසුමක් අත්සන් කළ රනිල් අද හමුදා ජයග්‍රහණ ඒ නින්දිත ගිවිසුමට බැරකිරීමට උත්සාහකිරීම මුළු ජාතියට ම කරන අපහාසයක් ලෙස සැලකිය යුතු ය. ඔහුගේ ඒ ප්‍රකාශයෙන් පිළිබිඹු වන්නේ ඔහුගේ යටත්විජිත යුදෙව් ක්‍රිස්තියානි මනස ය. ඊනියා සටන්විරාම ගිවිසුමෙන් සිදුවූයේ කොටින්ට ආයුධ සැපයීම ය. නෝර්වේ සහ අනෙක් බටහිර රටවල් තානාපති වරප්‍රසාද යොදාගනිමින් කොටින්ට දෙන ලද යුද්ධ හා වෙනත් ආධාර ගැන විධිමත් පරීක්ෂණයක් කළ යුතුව ඇත. උතුරු හා නැගෙනහිර පළාත් සංවර්ධනය කිරීම යන්නට මුවා වී රාජ්‍ය නොවන සංවිධාන කොටි සංවර්ධනය කර ඇති ආකාරය ද දැන් මැනවින් පැහැදිලි වෙයි. කොටි බංකර මෙන් ම කිලිනොච්චියේ ඊනියා පරිපාලන ගොඩනැගිලි ද තනා ඇත්තේ කාගේ ආධාරයෙන්දැයි වහා සොයා බැලිය යුතු ය. කොටි පරාජයකිරීම යනු නිවට කොටි පැරදවීම පමණක් නො වේ. ඒ බටහිර හා ඉන්දියාව ද පරාජයකිරීමකි. ලෝක බලවතා මෙන් ම කලාපීය බලවතා ද පරාජය කිරීම පහසු නොවීය. එහෙත් ඒ කළහැකි බව අපි පෙන්වා දුන්නෙමු. බටහිරයන්ගේ බලපෑම්වලට අප යටත් නොවන්නේ නම් ඔවුන්ට කළහැකි ඉට්ගෙඩියක් නැති බව අපි කීවෙමු. මහින්ද රාජපක්ෂ මහතා හිටපු ජනාධිපතිවරුන් හා වරියන් මෙන් නිවටයෙක් නො වේ. බටහිරට හෝ ඉන්දියාවට හෝ ඔහු හිස නො නැමී ය. ඔවුන්ගේ සියළු බලපෑම් හමුවේ ඒ මහතා ඉන්ද්‍රඛීලයක් සේ නොසැලී සිටියේ ය. ඒ මහතා විසින් දෙන ලද දේශපාලන නායකත්වය නොවන්නට මේ ජයග්‍රහණය ලබාගත නොහැකි බව සක්සුදක් සේ පැහැදිලි ය.  මහින්ද රාජපක්ෂ මහතාගේ ජයග්‍රහණය සමවන්නේ විජයබා රජු සොළීන් පැරදවීම සමග ය. සොළීහු එකල කලාපීය බලවත්තු වූහ. විජයබා රජු නොසිටින්නට සිංහල ජාතිය නැතිවන්නට තිබුණි. මහින්ද රාජපක්ෂ

© Prof. Nalin De Silva

මහතාට ස්තෝත්‍ර ගැයීමට මට අවශ්‍ය නැත. එහෙත් ඒ මහතාගේ භූමිකාව ඉතිහාසයට සාපේක්ෂව හැදෑරිය යුතු ය. ඒ මහතා සැසඳිය යුත්තේ ගැමුණු, වළගම්බා, දාසෙන්, විජයබා, පැරකුම්බා ආදී රජවරුන් සමග ය.

හතරවැනුව බලපෑවේ මතවාදී සාධකය ය. බටහිරයෝ ද රාජ්‍ය නොවන සංවිධානවල ඔවුන්ගේ ඇම්බැට්ටයෝ ද කෝටි අනභිබවනීය යැයි කීහ. තම්බයියා නම් ඊනියා සමාජවිද්‍යාඥයෙක් බුද්ධදහම පාවාදීම නමින් පොතක් පළකෙළේ ය. ඔහු සහ ඔහු වැන්නන් ප්‍රශ්න කෙළේ බෞද්ධයන් යුද්ධ කිරීම නිවැරදි ද යන්න ය. දෙමළ ජනයාට වූ අසාධාරණ ගැන පඬියෝ තොර තෝංචියක් නැතිව දෙඩවූහ. සිංහල බෞද්ධ අධිපතිවාදයක් ගැන ඔවුහු කතා කළහ. එහෙත් මේ සියල්ල මතවාදීව පරාජයකිරීමට අපට හැකිවිය. අපි පැහැදිලි සිංහල බෞද්ධ ප්‍රවාද ගොඩනැගුවෙමු. කෙටියෙන් කිවහොත් බටහිර ක්‍රිස්තියානි මතවාදය පරදවා අපි සිංහල බෞද්ධ මතවාදයක් ජයග්‍රහණය කෙරෙවුවෙමු. ඒ මතවාදී ජයග්‍රහණය සමග සුදු නෙළුම් ගෙන තවලම් ගිය අවලමුන් වෙනුවට සිංහ කොඩිය ඔසවාගෙන මෙහෙයුම් කිරීමට දිරි දුන් පිරිසක් ශ්‍රී ල නි පක්ෂයට නායකත්වය දීමට ඉදිරිපත්වූහ. ශ්‍රී ල නි ප නැවතත් සිංහලත්වයේ මගට පිවිසියේ ය.

පඬියන් නැවතත් දේශපාලන විසඳුම් බයිලාව ගයන වැවින් ප්‍රශ්නය කුමක්දැයි සැකෙවින් සොයා බලමු. දෙමළ ජාතිවාදය ඇරඹුණේ ලන්දේසින් දුම්කොළ වගාව සඳහා මෙරටට කෝරමණ්ඩල වෙරළෙන් කෘෂිකම්කරුවන් යන තේරුම ඇති වෙල්ලාල දෙමළ ජනයා ගෙන ඒමෙන් පසුව ය. නැගෙනහිර පළාතේ බිම්තීරුවක් සිංහල රජුගෙන් බද්දට ගෙන සිටි ලන්දේසීහු නැගෙනහිර පළාත සිංහලයන්ට අහිමිකිරීම සඳහා දෙමළ උගතුන් ලවා බොරු ඉතිහාස ලියවූහ. යාල්පානම් වෛපව මාලෙයි එහි ප්‍රතිඵලයක් විය. ඉන්පසු ඉංගිරිසිහු සිංහලයන්ට විරුද්ධව වෙල්ලාලයන් ලංකාවේ නායකයන් කිරීමට උත්සාහ ගත්හ. විශේෂයෙන් ම කුමාරස්වාමි පොන්නම්බලම් පවුල නායකත්වය සඳහා තෝරා ගැනිණි. රටේ සිංහලයන්ට හිමි තැන අහිමි කෙරිණි. දෙමළ ජාතිවාදී නායකයෝ ඉංගිරිසින්ගේ උපකාරයෙන් ව්‍යවස්ථාදායකයෙහි වැඩි නියෝජනත්වයක් ඉල්ලූහ. පනහට පනහ මෙහි එක් අවස්ථාවක් පමණක් විය. සිංහලයන්ට විරුද්ධව දෙමළ නායකයෝ ඊනියා අසාධාරණ හා බහුතරවාදය ගැන බයිලා කීහ. 1947 මැතිවරණයෙන් පසු සිංහල මන්ත්‍රී සංඛ්‍යාව වැඩිවීමත් සමග චෙල්වනායගම් මධ්‍යයෙහි නායකත්වයට පත්වීම සිහිනයක් බව දුටුවේ ය. ඔහු උතුරු හා නැගෙනහිර පළාත්වල වෙන ම රාජ්‍යයක් පිහිටුවීමට අදහස් කෙළේ ය. ඒ සඳහා ඔහු ලංකා දෙමළ රාජ්‍ය පක්ෂය හෙවත් ඊනියා ෆෙඩරල් පක්ෂය ගොඩනැගී ය. බොරු ඉතිහාසයක් නිර්මාණය කෙළේ ය. දෙමළ ජනයාට සිදු වී ඇතැයි කී ඊනියා අසාධාරණ ගැන කතා කෙළේ ය. 1976 දී ඔහු ඊළාම් අදහස දෙමළ පක්ෂවල ප්‍රතිපත්තිය බවට පත්කෙළේ ය. දෙමළ රාජ්‍යයක් වෙනුවෙන් නායකයන් කරන සටන මන්දගාමී යැයි සැලකූ තරුණයෝ අවි අතට ගත්හ. ඉන්දියාව හා බටහිර රටවල් විවිධ අවස්ථාවල සිංහලයන්ට එරෙහිව  ත්‍රස්තවාදය පෝෂණය කෙළේ ය. ඒ අතර සිංගලයෝ නිවට සාමකාරයන් බවට පත්කරනු ලැබූහ. බටහිර හා ඉන්දියාව දෙමළ ජනයාට නැති ප්‍රශ්නයක් විසඳීමට යැයි කියමින් රට බෙදීමට කටයුතු කෙළේ ය. ඒ සඳහා පළමු පියවරක් ලෙස  පළාත්සභා හා ෆෙඩරල් ඉදිරිපත් කෙරිණි. ඔවුන්ගේ උපක්‍රමය වූයේ ප්‍රභාකරන් පෙන්වමින් ඔහුගෙන් ගැලවීමට නම් බලය බෙදීමට යෝජනාකිරීම ය.

එහෙත් දැන් දෙමළ ජනයාට ඊනියා අසාධාරණයක් සිදු වී නැති බව පැහැදිලි ය. ප්‍රශ්නයක් ඇතොත් ඒ උප්පැන්න සහතිකය සිංහලෙන් තිබීම වැන්නකි. එහෙත් ඒ පරිපාලන ප්‍රශ්න පමණකි. එවැනි ප්‍රශ්න ඇතැම් සිංහලයන්ට ද වේ. දෙමළ ජනයාට දෙමළ වීම නිසා ඇති ප්‍රශ්නය කුමක් ද යන්න අසා දශක දෙකකට කිට්ටු වුවද තවම එයට පිළිතුරක් නැත. ප්‍රශ්නය වූයේ සිංහලයාට හිමි තැන අහිමි කළ දෙමළ ජාතිවාදය ය. ඒ විකාශය වී බෙදුම්වාදය හා ත්‍රස්තවාදය ඇතිවිය. අද එයට විසඳුමක් දී ඇත. ඒ හමුදා විසඳුමකි. හමුදා විසඳුම් ද දේශපාලන විසඳුම් වේ. දැන් මේ ඊනියා ප්‍රශ්නයට වෙනත් දේශපාලන විසඳුම් අවශ්‍ය නො වේ. සර්වපාක්ෂික නියෝජිත කමිටුව විසුරුවා හැරිය හැකි ය. එහෙත් ප්‍රශ්නයක් ඇත. ඒ ගොඩනැගී ඇති සිංහල ජාතියට දෙමළ  මුස්ලිම් ජනවර්ග එකතුකිරීම ය. එහි වගකීම දෙමළ හා මුස්ලිම් නායකයනට ය. සිංහල අධිපතිවාදයක් ගැන චෝදනා නගමින් බටහිරයන්ට අවශ්‍ය කාර්යය ඉටුකරනු වෙනුවට සිංහල සංස්කෘතිය මෙරට පොදු සංස්කෘතියේ ප්‍රධාන සංරචකය බව පිළිගනිමින් පොදු සංස්කෘතියකට ඇතුල්වීමට, ජාතික සංකලනයකට, ඔවුන් ඉදිරිපත්විය යුතු ය. සිංහලයන් ඔවුන්ට දොර විවෘතකර ඇත. ඇතුළට ඒම ඔවුන්ගේ වැඩකි. ඔවුන්ට ඔබාමාට මෙන් තම රටේ සංස්කෘතිය සමග සංකලනය වී ජනාධිපති වීමට ද  හැකි ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva